අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# ජෛවපද්ධති තාක්ෂණවේදය

## විෂය නිර්දේශය

## 12 හා 13 වන ශ්‍රේණි

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

තාක්ෂණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# ජෛවපද්ධති තාක්ෂණවේදය

12 සහ 13 වන ශ්‍රේණි
විෂය නිර්දේශය

ප්‍රථම මුද්‍රණය - 2017
ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

මුද්‍රණය :

## 1.0 හැඳින්වීම

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ ශ්‍රේණි සඳහා 2013 වර්ෂයේ දී හඳුන්වා දුන් ජෛවපද්ධති තාක්ෂණවේදය විෂය ඉතා කෙටි කාලයක් තුළ නැවත යාවත්කාලීන කිරීමට අවස්ථාවක් ලැබීම සතුටට කරුණකි.

ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් ලබා ගන්නා දනුම පදනම් කොටගෙන තාක්ෂණ අධ්‍යාපනය සඳහා වන අවස්ථා පුළුල් කිරීමත්, වැඩ ලෝකයට අවශ්‍ය මූලික තාක්ෂණ දනුම හා ප්‍රායෝගික අත්දැකීම් සිසුන්ට ලබා දීමත් මෙම විෂයය අධ්‍යයනය කිරීමෙන් සිදු කෙරේ.

කෘෂි විද්‍යාව, පරිසර විද්‍යාව, ව්‍යවහාර ජීව විද්‍යාව යන ප්‍රධාන ක්ෂේත්‍රවල දී නවීන තාක්ෂණය භාවිතය ඒකාබද්ධ කරමින් ජෛවපද්ධති තාක්ෂණවේදය විෂයය සකස් කර ඇති අතර මෙම විෂයය හදාරන සිසුන්ට, ඔවුන් ලබා ගන්නා දැනුම හා කුසලතා මගින්, ජාතික සංවර්ධන ක්‍රියාවලියට විශාල දයකත්වයක් ලබා දීමට හැකි වනු ඇත. තාක්ෂණය හා සම්බන්ධ මූලික කළමනාකරණ කුසලතා පිළිබඳ ව මෙම විෂය මගින් තහවුරු කරනු ලබන අතර නිෂ්පාදන අගය දම ක්‍රියාවලියේ දී තාක්ෂණය සමග ඒකාබද්ධ කරමින්, ව්‍යාපාරික ලෝකය දෙස නව මුහුණුවරකින් බැලීම සඳහා අවශ්‍ය දනුම ලබා දීම ද සිදු කෙරේ. එසේ ම ව්‍යවහාර දනුම, කුසලතා හා ආකල්ප තුළින් නවීන තාක්ෂණික දනුම පදනම් ආර්ථිකයක ඇති අභියෝග හඳුනා ගෙන ඒ සඳහා ප්‍රතිචාර දක්වීමට සිසුන් හුරු කිරීම ද මෙම විෂයයෙහි කාර්ය භාරයකි.

උසස් අධ්‍යාපනය සඳහා යොමු නොවන ශිෂ්‍යයන්ට වෘත්තියක් හෝ ස්වයං රැකියාවක් කිරීමට අවශ්‍ය නිපුණතා ලබා දෙන ක්‍රියාකාරකම් මෙම විෂයෙහි අඩංගු ව ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දයක විය හැකි ව්‍යවසායකත්ව කුසලතා ලබා දීමට හා පෞද්ගලික දිවි පැවැත්මට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම මෙම විෂයයෙන් අපේක්ෂිත ය.

මෙම විෂය නිර්දේශය තුළ ඇතුළත් ඉගෙනුම් ඵල සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය න්‍යායාත්මක දනුම හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ මෙන්ම ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් ද සිදු කළ යුතු වේ. මේ පිළිබඳ ව අවධානය යොමු කරමින් සිසු පරපුරට සාර්ථක ඉගෙනුම් අත්දැකීම් ලබා දීමට සුදුසු පරිසරයක් පාසල තුළ ගොඩ නගා දීම අප සියලු දෙනාගේ ම වගකීම විය යුතු ය.

## 2.0 ජාතික පොදු අරමුණු:

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ නැඟීම සහ ශ්‍රී ලාංකික අනන්‍යතාව තහවුරු කිරීම

II. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III. මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

VI. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

## 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය මත තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

| | | |
|---|---|---|
| සාක්ෂරතාව | : | සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : | භාණ්ඩ, අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| රූපක භාවිතය | : | රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව | : | පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම |

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | | |
|---|---|---|
| සමාජ පරිසරය | : | ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |
| ජෛව පරිසරය | : | සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා |

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

**ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව (2003 දෙසැම්බර්)**

## 4.0 විෂය නිර්දේශයේ අරමුණු

- එදිනෙදා ජීවිතයේ දී අවශ්‍ය වන තාක්ෂණික දැනුම වර්ධනය කිරීම
- වැඩ ලෝකයේ පවතින ගැටලු සඳහා විසඳුම් ලබා දීමට අවශ්‍ය කුසලතා වර්ධනය
- රැකියා පාදක කුසලතා වර්ධනය
- සිසුන්ගේ වෘත්තීය අධ්‍යාපනය ජාතික රාමුව සමග සම්බන්ධ කිරීම
- ජෛවපද්ධති තුළ දී වැඩ කටයුතු කරගෙන යාම සඳහා පාදක වන මූලික තාක්ෂණික නිපුණතා සංවර්ධනය කිරීම
- කළමනාකරණය සහ සැලසුම්කරණය සඳහා අවශ්‍ය වන මූලික කුසලතා වර්ධනය කිරීම
- විද්‍යාගාර ක්‍රියාකාරකම්, ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් හා උපකරණ සහ මෙවලම් පරිහරණය පිළිබඳ මූලික දැනුම, හසුරු කුසලතා ලබා දෙමින් රැකියා පාදක කුසලතා වර්ධනය කිරීම
- උසස් ගුණාත්මක නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා තාක්ෂණික ශිල්ප ක්‍රම ඵලදායී ව හා කාර්යක්ෂම ව යොදා ගැනීම සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම
- ජෛවපද්ධති තාක්ෂණවේද මූලධර්මවලට අදාළ නවෝත්පාදක හා පරීක්ෂණ උත්පාදනය කිරීම
- තාක්ෂණය පදනම් කර ගත් රැකියා අවස්ථාවන් හි නිරත වීම සඳහා සූදානම සිසුන් තුළ තහවුරු කිරීම

## 5.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් වැඩ පිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතය. ඒ මගින් සිසුන්ගේ ප්‍රවීණතාව තක්සේරු කළ හැකි ය.

12-13 ශ්‍රේණිවල ඇගයීම පාසල් මට්ටමින් සහ ජාතික මට්ටම යන අවස්ථා දෙකකින් සිදු වේ. පාසල් මට්ටමේ ඇගයීම පාසලෙන් සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබයි.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්මේ ඇගයීම වන අ.පො.ස. (උසස් පෙළ) විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තතමේන්තුවෙන් පවත්වනු ලැබේ. මෙහිදී ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 75ක් ද ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 25ක් ද ලබා දෙනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය ස්ථානීය පරීක්ෂණයකින් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් දෙකකින් සමන්විත වේ.

## එක් එක් නිපුණතාව සඳහා යෝජිත කාලච්ඡේද

### 12 ශ්‍රේණිය

| නිපුණතාව | කාලච්ඡේද |
|---|---|
| 1. ජෛවපද්ධති සඳහා සුදුසු කාලගුණික තත්ත්ව පිළිබඳ ව අදහස් ඉදිරිපත් කරයි. | 12 |
| 2. ජෛවපද්ධති ආශ්‍රිත පස පිළිබඳ ව විමර්ශනය කරයි. | 30 |
| 3. බිම් මැනීමේ සහ මට්ටම් ගැනීමේ සූදනම ප්‍රදර්ශනය කරයි. | 50 |
| 4. ජෛවපද්ධතිවල දී ජල ප්‍රභව පිළිබඳ ව විමර්ශනය කරයි. | 08 |
| 5. ජලයේ ගුණාත්මක බව නිර්ණය කරයි. | 22 |
| 6. වාණිජ මට්ටමින් ගුණාත්මක පැළ නිෂ්පාදනය කිරීමේ සූදනම ප්‍රදර්ශනය කරයි. | 18 |
| 7. උසස් තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගනිමින් ජලජ ජීව සම්පත් කර්මාන්තයේ නියැළීමට සූදනම ප්‍රදර්ශනය කරයි. | 22 |
| 8. උසස් තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගනිමින් සත්ත්ව නිෂ්පාදනයේ නියැළීමේ සූදනම ප්‍රදර්ශනය කරයි. | 38 |
| 9. ගුණාත්මක ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමවේද සැලසුම් කරයි. | 65 |
| 10. උසස් ගුණාත්මක නිෂ්පාදන සඳහා පසු අස්වනු තාක්ෂණ ශිල්ප ක්‍රම විමර්ශනය කරයි. | 15 |
| 11. බෝග වගාව සඳහා පාලිත පරිසර තත්ත්ව භාවිතයේ තාක්ෂණය පිළිබඳ ව විමර්ශනය කරයි. | 20 |
| **එකතුව** | 300 |

### 13ශ්‍රේණිය

| නිපුණතාව | කාලච්ඡේද |
|---|---|
| 12. යාන්ත්‍රීකකරණයේ සූදානම ප්‍රදර්ශනය කරයි. | 74 |
| 13. තිරසාර ලෙස ද්‍රව්‍යමය හා ද්‍රව්‍යමය නොවන නිෂ්පාදන පරිභෝජනය කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | 26 |
| 14. උචිත තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතයෙන් වැවිලි බෝග හා සුලු අපනයන බෝග ආශ්‍රිත නිෂ්පාදන සැකසීමේ සූදානම ප්‍රදර්නය කරයි. | 20 |
| 15. ක්‍රියාවලි පාලනය හා ස්වයංක්‍රීයකරණ යාන්ත්‍රණ ගොඩ නැංවීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | 72 |
| 16. විවිධ රැකියාවන්ට අදාළ වෘත්තීමය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්‍රියාමාර්ග භාවිතා කිරීමේ සූදනම ප්‍රදර්ශනය කරයි. | 08 |
| 17. උද්‍යාන විද්‍යාවෙහි නියැළීමේ සූදනම ප්‍රදර්ශනය කරයි. | 40 |
| 18. ජෛව පද්ධතිවල තිරසාර සංවර්ධනය සඳහා වැදගත් වන පරිසර හිතකාමී ක්‍රමෝපායයන් පිළිබඳ ව විමසා බලයි. | 45 |
| 19. නිෂ්පාදන සහ ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය කුසලතා දියුණු කර ගනියි. | 15 |
| **එකතුව** | 300 |

## 12 හා 13 වන ශ්‍රේණි සඳහා එක් එක් වාරයට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම්

| ශ්‍රේණිය | වාරය | නිපුණතා හා නිපුණතා මට්ටම් |
|---|---|---|
| 12 ශ්‍රේණිය | පළමු වාරය | පළමු නිපුණතාවේ සිට හතරවන නිපුණතාව දක්වා (නිපුණතා මට්ටම් 14) |
| | දෙවන වාරය | පස්වන නිපුණතාවේ සිට අට වන නිපුණතාව දක්වා (නිපුණතා මට්ටම් 12) |
| | තුන්වන වාරය | නමවන නිපුණතාවේ සිට එකොළොස් වන නිපුණතාව දක්වා (නිපුණතා මට්ටම් 17) |
| 13 ශ්‍රේණිය | පළමු වාරය | දොළොස්වන නිපුණතාවේ සිට දහතුන්වන නිපුණතාව දක්වා (නිපුණතා මට්ටම් 10) |
| | දෙවන වාරය | දාහතරවන නිපුණතාවේ සිට දහසයවන නිපුණතාව දක්වා (නිපුණතා මට්ටම් 10) |
| | තුන්වන වාරය | දාහත්වන නිපුණතාවේ සිට දහනමවන නිපුණතාව දක්වා (නිපුණතා මට්ටම් 11) |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1. ජෛවපද්ධති සඳහා සුදුසු කාලගුණික තත්ත්ව පිළිබඳ ව අදහස් ඉදිරිපත් කරයි. | 1.1 ජෛවපද්ධති කෙරෙහි බලපාන කාලගුණික සාධක පිළිබඳ ව විමසා බලයි | • කාලගුණය හා දේශගුණය<br>• දේශගුණික සාධක<br>• වර්ෂාපතනය<br>• සූර්යාලෝකය<br>• උෂ්ණත්වය<br>• සුළඟ<br>• සාපේක්ෂ ආර්ද්‍රතාව<br>• වායුගෝලීය පීඩනය<br>• විවිධ ජෛව පද්ධති කෙරෙහි දේශගුණික සාධක බලපාන ආකාරය | • කාලගුණය හා දේශගුණය අතර වෙනස පැහැදිලි කරයි.<br>• දේශගුණික සාධක නම් කරයි.<br>• ජෛව පද්ධති කෙරෙහි දේශගුණික සාධකවල බලපෑම විස්තර කරයි. | 04 |
| | 1.2 කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථානයක ක්‍රියාකාරිත්වය විමසා බලයි. | • කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථානය<br>• ස්ථානයක් තේරීම<br>• උපකරණ හා උපකරණ ස්ථාපනය<br>• දත්ත රැස් කිරීම<br>• දත්ත වාර්තා කිරීම<br>• ස්වයංක්‍රීය කාලගුණ මධ්‍යස්ථානය (Automated weather station)<br>• කාලගුණ අනාවැකි ප්‍රකාශනය<br>• වැදගත්කම | • කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේ දී සලකා බැලිය යුතු සාධක විස්තර කරයි.<br>• විවිධ කාලගුණික පරාමිති මැනීම සඳහා යොදා ගන්නා උපකරණ නම් කරයි.<br>• කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථානයක උපකරණ ස්ථාපනය කරන ආකාරය පැහැදිලි කරයි.<br>• අදාළ උපකරණ භාවිතයෙන් කාලගුණික පරාමිති නිර්ණය කරයි.<br>• ස්වයංක්‍රීය කාලගුණික මධ්‍යස්ථානයක් පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි.<br>• කාලගුණික තොරතුරු විකාශනයේ වැදගත්කම විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2. ජෛවපද්ධති ආශ්‍රිත පස පිළිබඳ ව විමර්ශනය කරයි. | 2.1 පාංශු ලක්ෂණ පිළිබඳ ව විමසා බලයි. | • පස<br>  • වැදගත්කම<br>  • ලක්ෂණ<br>    • භෞතික ලක්ෂණ<br>      • පාංශු වයනය<br>      • පාංශු වර්ණය<br>      • පාංශු ව්‍යුහය<br>      • පාංශු සංස්ථිතිය<br>      • පාංශු ජල ධාරිතාව<br>        • කාන්දු වීම් ශීඝ්‍රතාව<br>      • පාංශු උෂ්ණත්වය<br>      • පාංශු ඝනත්වය<br>    • රසායනික ලක්ෂණ<br>      • පාංශු pH අගය<br>      • කැටායන හුවමාරු ධාරිතාව (Cation Exchange Capacity - CEC)<br>      • විද්‍යුත් සන්නායකතාව (Electrical Conductivity - EC)<br>    • ජෛවීය ලක්ෂණ<br>      • ක්ෂුද්‍රජීවීන්<br>      • මජ්ජා ජීවීන්<br>      • මහා ජීවීන් | • පසේ වැදගත්කම විස්තර කරයි.<br>• පාංශු ලක්ෂණ කාණ්ඩගත කරයි.<br>• ජෛව පද්ධතියක දී පාංශු භෞතික ලක්ෂණවල බලපෑම විස්තර කරයි.<br>• පාංශු වයනය හා ව්‍යුහය නිර්ණය කරයි<br>• පාංශු වර්ණය නිර්ණය කරයි<br>• පාංශු සංස්ථිතිය නිර්ණය කරයි<br>• කාන්දු වීමේ ශීඝ්‍රතාව නිර්ණය කරයි.<br>• පාංශු දෘශ්‍ය හා සත්‍ය ඝනත්ව නිර්ණය කරයි<br>• පාංශු සච්ඡිද්‍රතාව ගණනය කරයි.<br>• ජෛව පද්ධතියක දී පාංශු රසායනික ලක්ෂණවල බලපෑම විස්තර කරයි.<br>• අහිතකර පාංශු රසායනික ලක්ෂණවල බලපෑම මග හරවා ගැනීමට නිවැරදි ක්‍රම පිළිවෙත් යෝජනා කරයි.<br>• පාංශු pH අගය නිර්ණය කරයි.<br>• පසෙහි විද්‍යුත් සන්නායකතාව නිර්ණය කරයි.<br>• විද්‍යුත් සන්නායකතාව අනුව පසේ තත්ත්වය පිළිබඳ ව අදහස් දක්වයි.<br>• ජෛවපද්ධතිවල දී පාංශු ජෛවීය ලක්ෂණවල බලපෑම විස්තර කරයි.<br>• පසක සිටින මහා ජීවීන් හඳුනා ගනියි. | 28 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 ශ්‍රී ලංකාවේ ප්‍රධාන පස් කාණ්ඩවල ලක්ෂණ විමර්ශනය කරයි. | • භාවිතයට අදාළ ව ශ්‍රී ලංකාවේ බහුල පස් කාණ්ඩ හා ඒවායේ ලක්ෂණ<br>• රතු දුඹුරු පස (Reddish Brown Earth - RBE soil)<br>• රතු කහ පොඩ්සොලික් පස (Red Yellow Podsolic - RYP soil)<br>• දියළු පස (Lowland Humic Glay - LHG soil)<br>• ලැටරයිට් පස | • ශ්‍රී ලංකාවේ බහුල පස් කාණ්ඩවල ලක්ෂණ හා ඒවායේ ව්‍යාප්තිය විස්තර කරයි.<br>• කාර්යයට අනුව සුදුසු පාංශු කාණ්ඩය යෝජනා කරයි. | 02 |
| 3. බිම් මැනීමේ සහ මට්ටම් ගැනීමේ සූදනම ප්‍රදර්ශනය කරයි. | 3.1 බිම් මැනීමේ මූලිකාංග පිළිබඳ ව විමසා බලයි. | • බිම් මැනීම<br>• භාවිත<br>• ඉඳි කිරීම්<br>• සිතියම් ඇඳීම<br>• කෘෂිකාර්මික කටයුතුවල දී<br>• මිනුම් වර්ග හා ඒකක<br>• රේඛීය මිනුම් (දුර)<br>• කෝණික<br>• ක්ෂේත්‍රඵලය<br>• පරිමාව<br>• සිතියම් සමග වැඩ කිරීම<br>• සංරචක<br>• පරිමාණය<br>• සංකේත<br>• දර්ශක<br>• සිතියමක මිනුම් ලබා ගැනීම | • බිම් මැනීමේ විවිධ භාවිත විස්තර කරයි.<br>• දුර සහ වර්ගඵලය මැනීමේ දී භාවිත වන ක්‍රම සහ උපකරණ නම් කරයි.<br>• බිම් මැනීමේ දී ඒකක ඒවායේ පරිවර්තන භාවිත කරයි.<br>• සිතියමක සංරචක විස්තර කරයි.<br>• සිතියමක විවිධ සංකේත නම් කරයි.<br>• සිතියමක පරිමාණයක් තේරීමේ දී සැලකිය යුතු සාධක විස්තර කරයි.<br>• සිතියම භූමියට සම්බන්ධ කරයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 බිම් මැනීමේ ශිල්ප ක්‍රම පිළිබඳ ව විමසා බලයි. | • බිම් මැනීමේ ශිල්ප ක්‍රම<br>• තල මේස මිණිත බිම් මැනීම<br>• දම්වැල් මැනීම<br>• මාලිමාව භාවිතයෙන් බිම් මැනීම (Compass surveying)<br>• තියොඩොලයිට් භාවිතයෙන් බිම් මැනීම<br>• විද්‍යුත් දුර මැනීම (EDM - Electronic Distance Measurement)<br>• ලෝක ව්‍යාප්ත යාත්‍රාචරණ චන්ද්‍රිකා පද්ධතිය (Global Navigation Satellite System - GNSS)<br>• ඡායා රේඛන මිතිය (Photogrammetry)<br>• දුරස්ථ සංවේදක<br>• භූගෝලීය තොරතුරු පද්ධතිය (Geographic Information System - GIS) | • විවිධ බිම් මැනුම් තාක්ෂණ ශිල්ප ක්‍රම නම් කරයි.<br>• විවිධ බිම් මැනුම් තාක්ෂණ ශිල්ප ක්‍රමවල භාවිත ලැයිස්තුගත කරයි.<br>• මාලිමාවක් භාවිතයෙන් බිම් මැනුමේ වාසි හා අවාසි විස්තර කරයි.<br>• අතේ රැඳන GPS භාවිතයෙන් දෙන ලද ස්ථානයක් නිර්ණය කරයි. | 08 |
| | 3.3 තල මේස බිම් මැනීමෙහි නියැළෙයි. | • තල මේස මිණිත බිම් මැනීම<br>• අවශ්‍ය උපකරණ<br>• ක්‍රම<br>• Traversing<br>• Radiation<br>• Traingulation<br>• එක් එක් ක්‍රමයෙහි වාසි හා අවාසි<br>• බිම් මැනුම් සැලැස්ම සැකසීම<br>• සිතියම් කියවීම<br>• භූමියේ ක්ෂේත්‍රඵලය ගණනය කිරීම | • තල මේස මිණිත බිම් මැනීම සඳහා අවශ්‍ය උපකරණ හඳුනා ගනියි.<br>• තල මේස මිණිත බිම් මැනීමේ පියවර විස්තර කරයි.<br>• තල මේස මිනිත ක්‍රමවල වාසි හා අවාසි සඳහන් කරයි.<br>• තල මේස මිණිත බිම් මැනීම මගින් බිම් සැකසුම් සැලැස්මක් ගොඩ නගයි.<br>• තල මේස මිණිත බිම් මැනීම මගින් භූමියක ක්ෂේත්‍රඵලය ගණනය කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.4 දම්වැල් බිම් මැනීමෙහි නියැළෙයි. | • දම්වැල් බිම් මැනීම<br>  • පාරිභාෂික වචන<br>  • පියවර<br>    • ක්ෂේත්‍ර වැඩ (බිම් මැනුම)<br>    • කාර්යාල වැඩ<br>      • සිතියම් ඇඳීම<br>      • ගණනය කිරීම<br>    • තාක්ෂණික ගැටලු<br>    • වාසි හා අවාසි | • දම්වැල් මැනීම සඳහා අවශ්‍ය උපකරණ ලැයිස්තු ගත කරයි.<br>• දම්වැල් බිම් මැනීමේ දී භාවිත වන පාරිභාෂික වචන ලැයිස්තු ගත කරයි.<br>• දම්වැල් බිම් මැනුමේ පියවර නම් කරයි.<br>• දම්වැල් බිම් මැනුම මගින් ඉඩමක කුඩා ඉඩමක් සඳහා සිතියමක් සකසයි.<br>• දම්වැල් බිම් මැනීම මගින් ක්ෂේත්‍රඵලය ගණනය කරයි.<br>• දම්වැල් මැනීමේ වාසි හා අවාසි විස්තර කරයි.<br>• තාක්ෂණික ගැටලු විස්තර කර ඒවා මග හැරවීමට විසඳුම් යෝජනා කරයි. | 08 |
| | 3.5 ක්ෂේත්‍රයේ දී මට්ටම් ගැනීමෙහි නියැළෙයි. | • මට්ටම් ගැනීම<br>  • භාවිත<br>    • පාරිභාෂික වචන මාලාව<br>    • ආකාර<br>      • පැතිකඩ මට්ටම් ගැනීම (Profile leveling)<br>      • අවකලන මට්ටම් ගැනීම (Differential leveling)<br>    • ක්‍රමවේදය<br>      • ක්ෂේත්‍ර වැඩ<br>        • උපකරණයේ උස මැනීම මගින් ක්‍රමය (Hight of of the instrument)<br>      • කාර්යාල වැඩ<br>        • ගණනය කිරීම<br>      • විය හැකි දෝෂ | • මට්ටම් ගැනීමේ විවිධ ක්‍රම නම් කරයි.<br>• මට්ටම් ගැනීමේ දී භාවිත වන උපකරණ හඳුනා ගනියි.<br>• කාර්යය අනුව සුදුසු මට්ටම් ගැනීමේ ආකාරය තෝරා ගනියි.<br>• ලක්ෂ්‍ය දෙකක සාපේක්ෂ උස සෙවීම සිදු කරයි.<br>• මට්ටම් ගැනීමේ නිරවද්‍යතාව නිර්ණය කරයි.<br>• මට්ටම් ගැනීමේ දී විය හැකි දෝෂ විස්තර කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.6 මට්ටම් ගැනීම සඳහා සමෝච්ඡ සිතියම්කරණය අත්හදා බලයි. | • සමෝච්චකරණය<br>  • භාවිත<br>  • පාරිභාෂික වචන මාලාව<br>  • ක්ෂේත්‍ර වැඩ<br>    • සෘජු සමෝච්චකරණය<br>    • වක්‍ර සමෝච්චකරණය<br>• සමෝච්ඡ සිතියම් පිළියෙල කිරීම<br>  • . %wd ď h (Grid system)<br>  • ස්ථානීය උස<br>  • සමෝච්ච රේඛා අන්තර් නිවේශනය<br>• සමෝච්ච රේඛා මගින් භූමියක ලක්ෂණ හඳුනා ගැනීම | • සමෝච්චකරණයේ භාවිත ලැයිස්තු ගත කරයි.<br>• සමෝච්චකරණයේ භාවිත වන පාරිභාෂික වචන අර්ථ දක්වයි.<br>• වක්‍ර සමෝච්චකරණ ක්‍රමවේදය විස්තර කරයි.<br>• උස අන්තර් නිවේශනය මගින් ස්ථානීය ගණනය කරයි.<br>• සමෝච්ච රේඛා භාවිතයෙන් විවිධ භූගෝලීය ලක්ෂණ පෙන්නුම් කරන දළ සටහන් අඳියි. | 06 |
| 4. ජෛවපද්ධතිවල දී ජල ප්‍රභව පිළිබඳ ව විමර්ශනය කරයි. | 4.1 ශ්‍රී ලංකාවේ ජල ප්‍රභව පිළිබඳ ව විමසා බලයි. | • ජල ප්‍රභව<br>  • පෘෂ්ඨීය<br>  • භූගත<br>• ජල ප්‍රභවයක් තේරීමේ දී සලකා බැලිය යුතු කරුණු<br>  • අවශ්‍යතා<br>    • කෘෂිකර්මය<br>    • ගෘහස්ථ<br>    • කර්මාන්ත සඳහා<br>    • වෙනත්<br>• වැසි ජලය රැස් කිරීම<br>  • ව්‍යුහ<br>  • භාවිත | • ජල ප්‍රභවවල භාවිත විස්තර කරයි.<br>• විවිධ අවශ්‍යතා සඳහා ජල ප්‍රභවයක් තේරීමේ දී සැලකිය යුතු කරුණු විස්තර කරයි.<br>• වැසි ජලය එක්රැස් කිරීමේ ක්‍රම විස්තර කරයි.<br>• වැසි ජලය රැස් කිරීම සඳහා ව්‍යුහයක ආකෘතියක් ඉදි කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 භූගත ජලය පිළිබඳ ව විමසා බලයි. | • භූගත ජලය<br>• පැවැත්ම සඳහා බලපාන සාධක<br>  • භූ විද්‍යාත්මක සාධක<br>    • පාංශු සච්ඡිද්‍රතාව<br>    • පසේ පාරගම්‍යතාව<br>  • ජලධර/ ජල සංචායක<br>  • භූගත ජලය පුනරාරෝපණය<br>    • වැදගත්කම<br>    • ක්‍රම<br>    • භූගත ජලය ක්ෂය වීම හා මැඩ පැවැත්වීම | • භූගත ජලයේ පැවැත්මට බලපාන සාධක විස්තර කරයි.<br>• ජලධර විස්තර කරයි.<br>• භූගත ජලය පුනරාරෝපණය වන ක්‍රම විස්තර කරයි.<br>• භූගත ජලය පුනරාරෝපණය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රම යෝජනා කරයි. | 04 |
| 5. ජලයේ ගුණාත්මක බව නිර්ණය කරයි. | 5.1 ජලයේ ගුණාත්මක බව ඇගයීම සිදු කරයි. | • ජලයේ ගුණාත්මක බව<br>  • පරාමිති<br>    • භෞතික<br>      • mØK wj , ï Nş >k øj H ^TSS)<br>      • වර්ණය<br>      • ගන්ධය<br>      • ආවිලතාව<br>      • උෂ්ණත්වය<br>    • රසායනික<br>      • pH අගය<br>      • ජෛව රසායනික ඔක්සිජන් ඉල්ලුම (BOD)<br>      • රසායනික ඔක්සිජන් ඉල්ලුම (COD)<br>      • ද්‍රාවීය ඔක්සිජන් (DO)<br>      • ලවණතාව/ විද්‍යුත් සන්නායකතාව<br>      • කඨිනත්වය<br>    • ජෛවීය<br>      • Total coliform<br>      • Fecal coliform<br>• නාගරික හා පානීය ජලයේ පැවතිය යුතු තතත්ව<br>• ප්‍රතිකාර කරන ලද අපජලයේ පැවතිය යුතු තත්ත්ව | • ජලයේ භෞතික, රසායනික හා ජෛවීය ගුණාංග විස්තර කරයි.<br>• ජලයේ භෞතික ලක්ෂණ නිර්ණය කරයි.<br>• ජලයේ රසායනික ලක්ෂණ නිර්ණය කරයි.<br>• ජලයේ ජෛවීය ලක්ෂණ නිර්ණය කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 දූෂිත ජලයේ බලපෑම විමසා බලයි. | • ජලය දූෂණය<br>  • ජල දූෂක ප්‍රභව<br>    • ස්ථානීය<br>    • ස්ථානීය නොවන<br>  • ජෛව පද්ධති කෙරෙහි බලපෑම | • විවිධ ජල දූෂක ප්‍රභව විස්තර කරයි.<br>• ජෛව පද්ධති කෙරෙහි ජල දූෂණයේ බලපෑම විස්තර කරයි. | 02 |
| | 5.3 අපජලය පවිත්‍රණය පිළිබඳ ව විමසා බලයි. | • අපජල ප්‍රභව<br>  • කාර්මික<br>  • ජල ජීව<br>  • ගෘහස්ථ<br>• අපජලය පවිත්‍රණය<br>  • වැදගත්කම<br>  • ක්‍රියාවලිය<br>    • මූලික පිරියම් කිරීම<br>    • ප්‍රාථමික පිරියම් කිරීම<br>    • ද්විතියික පිරියම් කිරීම<br>    • තෘතීයික පිරියම් කිරීම | • විවිධ අපජල ප්‍රභව විස්තර කරයි.<br>• අපජලය පිරිපහදු කිරීමේ වැදගත්කම විස්තර කරයි.<br>• අපජල පිරිපහදු ක්‍රියාවලිය විස්තර කරයි. | 04 |
| 6. වාණිජ මට්ටමින් ගුණාත්මක පැළ නිෂ්පාදනය කිරීමේ සූදනම ප්‍රදර්ශනය කරයි. | 6.1 උසස් තාක්ෂණික ශිල්ප ක්‍රම භාවිතයෙන් ශාක ප්‍රචාරණයෙහි නියැළෙයි. | • ශාක ප්‍රචාරණ ක්‍රම<br>  • ලිංගික<br>  • අලිංගික<br>• උසස් අලිංගික ශාක ප්‍රචාරණ ක්‍රම ශිල්ප<br>  • අතු බැඳීම<br>    • වායව අතු බැඳීම<br>    • භෞමික අතු බැඳීම<br>  • අංකුර හා රිකිලි බද්ධ කිරීම<br>  • ක්ෂුද්‍ර ප්‍රචාරණය | • ශාක ප්‍රචාරණයේ ප්‍රධාන ක්‍රම නම් කරයි.<br>• ලිංගික හා අලිංගික ප්‍රචාරණ ක්‍රමවල වාසි අවාසි සන්සන්දනය කරයි.<br>• ශාක විශේෂය අනුව අතු බැඳීමේ විවිධ ශිල්ප ක්‍රම අත්හදා බලයි.<br>• ශාක විශේෂ අනුව සුදුසු අංකුර හා රිකිලි බද්ධ කිරීමේ ශිල්ප ක්‍රම අත්හදා බලයි.<br>• ක්ෂුද්‍ර ප්‍රචාරණය අත්හදා බලයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 පැළ තවාන් ශිල්ප ක්‍රම විමසා බලයි. | • පැළ තවාන්<br>  • අරමුණු හා ප්‍රතිලාභ<br>  • වාණිජ ව භාවිත වන බඳුන් තවාන්<br>    • සමූහ පැළ බඳුන් (Compots)<br>    • බඳුන්<br>    • ජෛව හායන ලක් වන තවාන් බඳුන්<br>    • පොලිතින් මලු<br>• ශාක රෝපණ ද්‍රව්‍ය තේරීම හා සැකසීම<br>  • මව් ශාක තේරීම<br>  • අතු කැබලි/ බීජ තේරීම සහ සූදනම් කිරීම<br>  • තවාන් පැළ නිෂ්පාදනය<br>    • වගා මාධ්‍ය සකස් කිරීම<br>    • ජීවානුහරණය<br>    • වගා මාධ්‍ය පිරවීම<br>    • පශ්චාත් සාත්තු<br>      • රෝග හා පළිබෝධ පාලනය<br>    • පැළ දැඩි කිරීම<br>  • පැළ ශ්‍රේණිගත කිරීම<br>  • ප්‍රවාහනයට සූදනම් කිරීම<br>  • ගුණාත්මක ප්‍රමිති | • පැළ තවානක වැදගත්කම විස්තර කරයි.<br>• වාණිජ ව භාවිත කරන විවිධ තවාන් බඳුන් වර්ග විස්තර කරයි.<br>• තවාන් පැළ නිෂ්පාදනය කර නිවැරදි ව නඩත්තු කරයි.<br>• තවාන් පැළ ශ්‍රේණිගත කිරීමේ දී හා ප්‍රවාහනයේ දී සලකා බැලිය යුතු සාධක විස්තර කරයි.<br>• තවාන් පැළවල තිබිය යුතු ගුණාත්මක ප්‍රමිති ලැයිස්තු ගත කරයි. | 08 |
| 7. උසස් තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගනිමින් ජලජ ජීව සම්පත් කර්මාන්තයේ නියැළීමට සූදානම ප්‍රදර්ශනය කරයි. | 7.1 විසිතුරු මත්ස්‍ය කර්මාන්තය පිළිබඳ ව විමසා බලයි. | • මිරිදිය විසිතුරු මත්ස්‍ය වගාව<br>  • වැදගත්කම<br>  • වගා කරන විශේෂ<br>    • බිත්තර දමන<br>    • පැටවුන් දමන<br>  • මව් සතුන් තේරීම හා අභිජනනය<br>  • පැටවු ඇති කිරීම<br>  • ක්‍රමවේදය<br>    • මත්ස්‍ය ටැංකිය සැකසීම<br>    • මත්ස්‍යයින් හඳුන්වා දීම<br>    • ආහාර සැපයීම<br>    • රෝග කළමනාකරණය<br>    • අස්වනු නෙළීම<br>    • ඇසුරුම්කරණය හා ප්‍රවාහනය | • විසිතුරු මත්ස්‍ය වගාව සඳහා සුදුසු මිරිදිය මත්ස්‍ය විශේෂ හඳුනා ගනියි.<br>• මව් මත්ස්‍යයන් ඇති කරන හා අභිජනනය කරන අයුරු විස්තර කරයි.<br>• මත්ස්‍ය කීටයන් සඳහා මත්ස්‍ය ආහාරයක් සකසයි.<br>• මත්ස්‍ය ටැංකියක් නඩත්තු කරයි.<br>• වෙළෙඳපොළ සඳහා මත්ස්‍ය අස්වනු ඇසුරුම්කරණය සිදු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.2 ආහාරමය මත්ස්‍ය වගා ක්‍රම ශිල්ප පිළිබඳ ව විමසා බලයි. | • ආහාරමය මත්ස්‍ය වගාව<br>  • වගා කරන විශේෂ<br>    • මිරිදිය<br>    • කිවුල් දිය<br>  • ක්‍රමවේදය<br>    • ස්ථානය තේරීම<br>    • පොකුණ සැකසීම<br>    • මත්ස්‍යයින් හඳුන්වා දීම<br>    • ආහාර සැපයීම<br>    • අස්වනු නෙළීම | • ආහාර සඳහා සුදුසු මත්ස්‍ය විශේෂ හඳුනා ගනියි.<br>• ආහාරමය මත්ස්‍ය වගා ක්‍රමවේදය විස්තර කරයි.<br>• පරිණත මත්ස්‍ය අස්වනු නෙළීමේ ක්‍රමවේද විස්තර කරයි. | 04 |
| | 7.3 විසිතුරු ජලජ පැළෑටි වගාව පිළිබඳ ව විමසා බලයි. | • ජලජ පැළෑටි වගාව<br>  • හැඳින්වීම<br>  • ආර්ථිකමය වැදගත් පැළෑටි<br>    • විසිතුරු<br>    • ආහාරමය<br>• විසිතුරු ජලජ පැළෑටි වගාව<br>  • වගා ශිල්ප ක්‍රම<br>  • ප්‍රචාරණ ක්‍රම<br>  • නඩත්තුව<br>  • අස්වනු නෙළීම<br>  • වෙළෙඳපොළ සඳහා ඇසිරීම | • ආර්ථිකමය වැදගත් ජලජ ශාක තෝරා ගනියි.<br>• සුදුසු වගා ශිල්ප ක්‍රම අනුගමනය කරයි.<br>• විසිතුරු ජලජ පැළෑටි වගාවක් නඩත්තු කරයි.<br>• වෙළෙඳපොළ සඳහා විසිතුරු ජලජ පැළෑටි සකස් කරන ආකාරය විස්තර කරයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8. උසස් තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගනිමින් සත්ත්ව නිෂ්පාදනයේ නියැළීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | 8.1 ගොවිපොළ සත්ත්ව නිෂ්පාදනයේ දී යොදා ගන්නා තාක්ෂණික ශිල්ප ක්‍රම පිළිබඳ ව විමසා බලයි. | • ගොවිපොළ සත්ත්ව නිෂ්පාදනය සඳහා උසස් තාක්ෂණය යොදා ගැනීම<br>• වැදගත්කම<br>• කුකුළු පාලනය<br>• සතුන් ඇති කරන ක්‍රම හා නිවාස<br>• බෲඩර, ඝන ආස්තරණ ක්‍රමය<br>• බිත්තර රක්කවීම<br>• කෘත්‍රිම ක්‍රමය<br>• තත්ත්ව<br>• බිත්තර තේරීම<br>• දිනක් වයසැති ගුණාත්මක කුකුල් පැටවුන්<br>• ආහාර සැපයීම<br>• ජලය සැපයීම<br>• සෞඛ්‍ය කළමනාකරණය<br>• ගව පාලනය<br>• සතුන් ඇති කරන ක්‍රම හා නිවාස<br>• ආහාර සැපයීම<br>• ජලය සැපයීම<br>• යන්ත්‍ර මගින් කිරි දෙවීම<br>• සතුන් හඳුනා ගැනීම<br>• සනීපාරක්ෂාව හා සෞඛ්‍යය කළමනාකරණය | • ගොවිපොළ සත්ත්ව නිෂ්පාදනයේ දී උසස් තාක්ෂණික ක්‍රම යොදා ගැනීමේ වැදගත්කම විස්තර කරයි.<br>• බිත්තර රක්කවීමේ ක්‍රම වෙන් කර හඳුනා ගනියි.<br>• ප්‍රදේශයේ පවතින සම්පත් භාවිත කර බිත්තර රක්කවීමේ උපකරණයක් සකසයි.<br>• කුකුළු හා එළ ගව පාලනයේ දී උසස් තාක්ෂණික ක්‍රම යොදා ගන්නා අයුරු විස්තර කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 වාණිජ කිරි නිෂ්පාදන කර්මාන්තයට අවශ්‍ය තත්ත්ව විමසා බලයි. | • වාණිජ කිරි නිෂ්පාදන කර්මාන්තය<br>• වැදගත්කම<br>• ගුණාත්මක බව තක්සේරුව<br>• භෞතික<br>• රසායනික<br>• ජෛවීය<br>• කිරි අපමිශ්‍රණය<br>• හඳුනා ගැනීම<br>• කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක තාක්ෂණික අවශ්‍යතා<br>• කිරි නිෂ්පාදන සඳහා සැකසීම<br>• පිරිසිදු කිරීම<br>• ප්‍රමිතිකරණය<br>• වෙන් කිරීම<br>• සමජාතීකරණය | • කිරිවල ගුණාත්මක බව කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.<br>• පරීක්ෂා මගින් ගුණාත්මක කිරි හඳුනා ගනියි.<br>• කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක තාක්ෂණික අවශ්‍යතාව විස්තර කරයි.<br>• කිරි සැකසීමේ කර්මාන්තයේ පොදු තාක්ෂණික ශිල්ප ක්‍රම විස්තර කරයි. | 06 |
| | 8.3 බ්‍රොයිලර් මස් කර්මාන්තය පිළිබඳ ව විමසා බලයි. | • ගුණාත්මක බ්‍රොයිලර් මස්<br>• වැදගත්කම<br>• බලපාන සාධක<br>• සැකසීම<br>• ක්‍රමවේදය<br>• වෙළෙඳපොළ ආකාර<br>• සම්පූර්ණ බ්‍රොයිලර් කුකුළු මස්<br>• වාණිජමය වටිනාකමක් ඇති වෙන් කරන ලද කොටස්<br>• අගය එකතු කරන කුකුළු මස් නිෂ්පාදන | • ගුණාත්මක බ්‍රොයිලර් මස් නිෂ්පාදනයේ වැදගත්කම විස්තර කරයි.<br>• බ්‍රොයිලර් මස්වල ගුණාත්මක බව කෙරෙහි බලපාන සාධක විස්තර කරයි.<br>• බ්‍රොයිලර් මස් නිෂ්පාදන ක්‍රියාවලියේ පියවර විස්තර කරයි.<br>• කුකුලු මස් වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ විවිධ ආකාර දක්වයි.<br>• අගය එකතු කළ කුකුළු මස් සකසයි. | 08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.4 බිත්තර ආශ්‍රිත නිෂ්පාදනවල නව ප්‍රවණතා පිළිබඳ ව විමසා බලයි. | • බිත්තර හා බිත්තර ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය<br>• ගුණාත්මක බිත්තරවල ලක්ෂණ හා ඒවා හඳුනා ගැනීමේ පරීක්ෂා<br>• බාහිර<br>• අභ්‍යන්තර<br>• බිත්තර වර්ගීකරණය (USA ප්‍රමිතියට අනුව)<br>• වැදගත්කම<br>• බිත්තර ආශ්‍රිත නිෂ්පාදන | • ගුණාත්මක බිත්තර තෝරයි.<br>• විවිධ නිර්ණායක අනුව බිත්තර කාණ්ඩ කරයි.<br>• බිත්තර ආශ්‍රිත නිෂ්පාදන සැකසීමේ ක්‍රම විස්තර කරයි.<br>• බිත්තර ආශ්‍රිත නිෂ්පාදන සකසයි. | 08 |
| 9. ගුණාත්මක ආහාර නිෂ්පාදනය සඳහා ක්‍රමවේද සැලසුම් කරයි. | 9.1 ආහාර නරක් වීම සඳහා බලපාන සාධක පිළිබඳ ව විමසා බලයි. | • ආහාර නරක් වීම<br>• බලපාන සාධක<br>• භෞතික සාධක<br>• උෂ්ණත්වය<br>• සාපේක්ෂ ආර්ද්‍රතාව<br>• ආහාර අපමිශ්‍රකාරක<br>• රසායනික සාධක<br>• ජෛවීය සාධක<br>• එන්සයිම<br>• කෘමීන් සහ කෘන්තකයින්<br>• ක්ෂුද්‍රජීවීන්<br>• ක්ෂුද්‍රජීවීන් වර්ධනය සඳහා ප්‍රශස්ත තත්ත්ව | • ආහාර නරක් වීමට බලපාන විවිධ සාධක ලයිස්තුගත කරයි.<br>• භෞතික සාධක ආහාර නරක් වීමට බලපාන ආකාරය විස්තර කරයි.<br>• ආහාර නරක් වීම කෙරෙහි රසායනික හා ජෛවීය සාධකවල බලපෑම විස්තර කරයි.<br>• ආහාර නරක් වීමට බලපාන ක්ෂුද්‍රජීවීන්ගේ ක්‍රියාකාරීත්වය සඳහා යෝග්‍ය තත්ත්ව හඳුනා ගනියි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.2 ආහාර පරිරක්ෂණ මූලධර්ම අනුගමනය කර ආහාර පරිරක්ෂණ ක්‍රමවේද සැලසුම් කරයි. | • ආහාර පරිරක්ෂණය<br>  • අරමුණ සහ වැදගත්කම<br>  • මූලධර්ම<br>    • නිෂේධනය<br>    • අක්‍රිය කිරීම<br>  • පූර්ව ප්‍රතිකාර<br>    • බ්ලාන්චිකරණය<br>  • ක්‍රමවේද<br>    • භෞතික ක්‍රමවේද<br>      • තාපමය පරිරක්ෂණ<br>        • ජීවාණුහරණය<br>        • පැස්ටරීකරණය<br>      • අඩු උෂ්ණත්ව යෙදවීම්<br>        • ශීත කිරීම<br>        • අධි ශීත කිරීම<br>      • විජලනය<br>      • සාන්ද්‍රීකරණය<br>      • ප්‍රවිකිරණය<br>      • රසායනික ක්‍රම<br>        • පරිරක්ෂක එකතු කිරීම<br>        • දුම් ගැසීම<br>      • ජෛව රසායනික ක්‍රම<br>        • පැසවීම<br>      • i xhbq a ^Combined) ක්‍රම | • ආහාර පරිරක්ෂණයේ වැදගත්කම විස්තර කරයි.<br>• ආහාර පරිරක්ෂණයේ මූලධර්ම සඳහන් කරයි.<br>• සාම්ප්‍රදායික ආහාර පරිරක්ෂණ ක්‍රමවල ඇති ආහාර පරිරක්ෂණ මූලධර්ම හඳුනා ගනියි.<br>• එක් එක් ආහාර වර්ග සඳහා ගැළපෙන ආහාර පරිරක්ෂණ ක්‍රමවේද යෝජනා කරයි.<br>• විවිධ ක්‍රම භාවිත කර ආහාර පරිරක්ෂණය සිදු කරයි. | 16 |
| | 9.3 ආහාර සැකසීම සම්බන්ධ නව ප්‍රවණතා පිළිබඳ ව විමසා බලයි. | • ආහාර සැකසීමේ නව ප්‍රවණතා<br>  • අගය එකතු කිරීම<br>  • සරු කිරීම<br>  • ප්‍රබල කිරීම<br>  • අවම සැකසීම<br>  • අධි පීඩන සැකසීම (High pressure processing)<br>  • විද්‍යුත් ස්පන්දන තාපනය (Pulse electric heating<br>  • පටල පෙරීම (Membrane filtration) | • ආහාර සැකසීමේ නව ප්‍රවණතා විස්තර කරයි.<br>• අගය එකතු කළ ආහාර සකසයි.<br>• ආහාර අවම සැකසීම අත්හදා බලයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් ඵල | කාලච්ඡේද |
|---|---|---|---|---|
